ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
இலங்கை சட்ட உதவி ஆணைக்குழு
Legal Aid Commission of Sri Lanka

# පවුල හා බැඳි නීතිය (II කොටස)

## නඩත්තුව, භාරකාරත්වය, ගෘහස්ථ ප්‍රචන්ඩත්වය



USAID/CORE ව්‍යාපෘතියේ ආධාර මත සකසන ලදී

USAID
FROM THE AMERICAN PEOPLE

USAID
FROM THE AMERICAN PEOPLE

## වගකීමෙන් මිදීමේ ප්‍රකාශය

“අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයේ (USAID) හරහා ලැබෙන ඇමරිකානු ජනතාවගේ පරිත්‍යාගශීලිත්වය මත මෙම ප්‍රකාශනය එළි දැක්වේ. මෙම වාර්තාවේ අන්තර්ගතය පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව සතුවන අතර එමඟින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයෙහි (USAID) හෝ ඇමෙරිකානු එක්සත් ජනපද රජයේ මතය කිසිඳු අයුරකින් පිළිබිඹු නොවන බව සැලකුව මැනව.”

Ministry of Justice

# පවුල හා බැඳි නීතිය

නඩත්තුව, භාරකාරත්වය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**

සම්පාදනය
නීතිඥ දමයන්ති දිසානායක, LLB

*copyrights@ Legal Aid Commission of Sri Lanka*



# සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27)දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. වරප්‍රසාද නොලත් ප්‍රජාවන්ට නොමිලේ නීතිමය උපදෙස් ලබාදෙන අරමුණින් ව්‍යාවස්ථාපිත නීති ආයතනයක් ලෙස කොමිසම මානව හිමිකම්, ළමා අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, වැඩිහිටි අයිතිවාසිකම්, පවුල් නීතිය, කම්කරු නීතිය, වැනි ක්ෂේත්‍ර කිහිපයක නීතිමය සහය ලබාදෙයි. හැකිතාක් සිවිල් නීතියේ සහන සැලසීමට, දැනුවත් කිරීමට සහ මඟපෙන්වීම සඳහා අපගේ ආධාර පුළුල් කර ඇත්තෙමු.

අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන බොහෝ සංවිධාන තිබුනත්, ශ්‍රී ලංකා රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නීතිමය කටයුතු කරගෙන යාමට නීතිමය බලය ඇති එකම ආයතනය නීති ආධාර කොමිෂන් සභාවයි.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව ආදායම, සමාජ තත්වය, ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වයස නොසලකා උපදෙස් ලබා දෙයි. පීඩිත සහ අවදානමට ලක්ව ඇති දිවයින පුරා විසිරී සිටින දහස් ගනනකට නීතියේ පිහිට සමානව ලබාදීම ගැන අප ආඩම්බර වෙමු.

මෙම පොත් එකතුව ප්‍රජාවන්ට, නිලධාරින්ට සහ පුද්ගලයන්ට නීතිය අවබෝධ කර ගැනීමටත්, ඔවුන් ගේ අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව දැනුවත් වීමටත් අත්වැලක් වේ. තව දුරටත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ නිලධාරීන් මඟින් අවශ්‍ය නීතිමය සහය සහ උපදෙස් ලබා ගත හැකි බව දැනුවත් වීමට මෙය උපකාර වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

**ජනාධිපති නීතිඥ රොහාන් සහබන්දු**
සභාපති, ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

# ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27) දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. එමඟින් අවදානමට ලක් විය හැකි, අඟහිඟකම් ඇති ප්‍රජාවන්ට, සමාජ තත්වයෙන් හෝ ආර්ථික තත්වයෙන් හෝ ස්ත්‍රී පුරුෂ භාවය අනුව යුක්තිය සඳහා ප්‍රවේශ වීම සීමා වී ඇති පුද්ගලයින්ට නීති ආධාර සැපයීම උදෙසා පිහිටුවන ලද්දකි.

තිරසාරභාවය හා ස්ථාවරත්වය උදෙසා නීතිමය ආධාර සපයන වෙනත් ආයතන හා සංවිධාන අතරින් මෙම කොමිසන් සභාව ප්‍රමුඛස්ථානයක් ගනී.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව දිවයින පුරා පළාත් 9 ක මධ්‍යස්ථාන 84 පවත්වා ගෙනයන අතර දැනුවත් කිරීම සහ ආදයම් සීමාවකින් තොරව සියලුම දෙනාට නීති උපදෙස් සම්පාදන ලබා දීම පිළිබඳව අවබෝධ කිරීම් සිදුකරයි. එහි ස්ථිර නීතිඥයින් 120ට අධික සංඛ්‍යාවක් සහ නිදහස් වෘත්තීක නීතිඥයන් 1000 ට අධික සංඛ්‍යාවක් කාර්යයේ නිරත වේ.

"කොමිෂන් සභාවේ දැක්ම වන්නේ සියලුම ශ්‍රී ලාංකිකයන්ට යුක්තිය සඳහා සමාන ප්‍රවේශක් තිබිය යුතු සමාජයක් නිර්මාණය කිරීමයි." මෙම අරමුණ සාක්ෂාත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව බොහෝ ව්‍යාපෘති සිදුකර ඇත.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ මෙහෙවර වන්නේ රටේ නීතිමය පිහිට ලැබිය යුතු පුද්ගලයන්ට පිහිට ආධාර ලබාදීම බව පනතේ සඳහන් වේ.

# අපගේ දැක්ම

## යුක්තියට සම ප්‍රවේශයක්

ශ්‍රී ලාංකිකයින්ට ඔවුන්ගේ ආර්ථික හෝ සමාජ තත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, කුලය, ආගම හෝ ජාතිකත්වය හෝ ආබාධිතභාවය නොසලකා යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් ඇති සමාජයක් නිර්මාණය කිරීමයි.

# පටුන

පිටු අංකය


| | |
|---|---|
| නඩත්තු නඩු | 01 |
| භාර්යාව ස්වාමි පුරුෂයාගෙන් නඩත්තු සඳහා ඉල්ලීමක් කරන අවස්ථාවක පහත සඳහන් කරුණු සම්පූර්ණ විය යුතුයි | 02 |
| දරුවන්ගේ භාරකාරත්වය | 06 |
| දරුවකු කුලවද්දා ගැනීම හෙවත් දරුකමට හදා ගැනීම | 09 |
| විවාහ පොරොන්දු කඩ කිරීම | 13 |
| ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය | 15 |
| LAC මධ්‍යස්ථාන පිහිටි ස්ථාන | 18 |



පවුල හා එයට අදාල නීතිය පිළිබඳව සළකා බැලීමේදී විවාහය සහ දික්කසාදය පිළිබඳව මෙම පොතෙහි පළමුවන කොටස මඟින් සාකච්ඡා කරන ලදී.

මෙම දෙවන කොටස මඟින් නඩත්තු, දරුවන්ගේ භාරකාරත්වය, කුලවද්දා ගැනීම (දරුකමට හදාගැනීම) ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය විවාහ පොරොන්දු කඩ කිරීම, යනාදී කරුණු පිළබඳව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.

## නඩත්තු නඩු

### නඩත්තු ලබා ගැනීමට හිමිකම් ඇත්තේ කාහට ද?

- බිරිඳට ස්වාමි පුරුෂයාගෙන් ද, ස්වාමි පුරුෂයාට බිරිඳගෙන් ද නඩත්තු ලබාගත හැකිය.

- අවුරුදු 18 සිට වැඩි 25 දක්වා වූ අවිවාහක දරුවෙකුට ද පියාගෙන් මෙන්ම මවගෙන් ද නඩත්තු ලබාගත හැකිය.

> “ වර්තමාන ශ්‍රී ලංකාවේ නඩත්තු නීතිය 1999 අංක 37 දරණ නඩත්තු පනතේ අන්තර්ගත වේ. කාලාන්තරයක් තිස්සේ අපේ රටේ ක්‍රියාත්මක වූ නඩත්තු නීතියේ වර්ධනාත්මක තත්වයක් නව නීතියේ දක්නට ඇත. ”

**භාර්යාව ස්වාමි පුරුෂයාගෙන් නඩත්තු සඳහා ඉල්ලීමක් කරන අවස්ථාවක පහත සඳහන් කරුණු සම්පූර්ණ විය යුතුයි.**

1. බිරිඳට තමාව නඩත්තු කර ගැනීමට නොහැකි විය යුතුය.
2. පුරුෂයාට ප්‍රමාණවත් වත්කමක් තිබිය යුතුය.
3. පුරුෂයා බිරිඳ නඩත්තු කිරීම ප්‍රතික්ෂේප කළ යුතුය. නොඑසේ නම් නොසලකා හැරිය යුතුය.

### පුරුෂයාට හෝ භාර්යාවට ප්‍රමාණවත් වත්කමක් තිබිය යුතුය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද ?

මෙම කරුණ නඩු තීන්දු ගණනාවකම දීර්ඝ ලෙස සාකච්ඡා වී ඇත. ස්වාමි පුරුෂයාට නැතිනම් පියාට රැකියාවක් ඇති නැති බව මෙහිදී වැදගත් වන්නේ නැත. ඔහුට රැකියාවක් කිරීමට හැකියාවක් ඇති නීරෝගී පුද්ගලයෙක් ද යන්න පමණක් නඩත්තු ගෙවීමේ නියෝගයක් කිරීමේ දී අධිකරණය විසින් සලකා බලනු ලැබේ.

### නඩත්තු නඩුවක් පැවරිය යුතු උසාවිය කුමක්ද?

භාර්යාව, ස්වාමි පුරුෂයාගෙන් නඩත්තු සඳහා ඉල්ලීමක් කරන අවස්ථාවක ඇය පදිංචි ප්‍රදේශයේ පිහිටි මහේස්ත්‍රාත් අධිකරණයේ හෝ ස්වාමි පුරුෂයා පදිංචි ප්‍රදේශයේ පිහිටි මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව පැවරිය යුතුය.

### නඩත්තු ගෙවීමේ වගකීමෙන් නිදහස් විය හැකි අවස්ථා තියෙනවාද?

නඩත්තු සඳහා ඉල්ලීම කරන භාර්යාව අනාචාරයේ ජීවත් වනවිට ද දෙදෙනාගේ කැමැත්තෙන් වෙන්වී සිටින විට ද භාර්යාවට ස්වාමි පුරුෂයාගෙන් නඩත්තු ඉල්ලා සිටිය නොහැකිය.



**අනෙක් පාර්ශවය ?**
නඩත්තු සඳහා ඉල්ලීම කරන ස්වාමි පුරුෂයා අනාචාරයේ ජීවත් වෙන විට ද දෙදෙනාගේ කැමැත්තෙන් වෙන් වී සිටින විට ද ස්වාමි පුරුෂයාට භාර්යාවගෙන් නඩත්තු ඉල්ලා සිටිය නොහැකිය.

ස්වාමි පුරුෂයා සහ භාර්යාව දික්කසාද වූ විට, දික්කසාදයෙන් පසු ස්වාමි පුරුෂයෙක් හෝ භාර්යාවක් නැති බැවින් නඩත්තු ලබාගැනීම කළ නොහැක.

**අනියම් භාර්යාවට පුරුෂයකුගෙන් නඩත්තු ලබාගත හැකි ද?**
දරුවන් නඩත්තු කිරීම පැහැර හරින පියෙකුට පමණක් නොව මවකටත් විරුද්ධව නඩත්තු ලබාගැනීම සඳහා නඩු පැවරිය හැකිය. මෙහි දී දරුවා අනියම් සැමියාගේ බව ඔහු පිළිගතහොත් හෝ පරීක්ෂණයක් මඟින් ඔප්පු වුවහොත්, එකී දරුවාට නඩත්තු ගත හැක.

**දරුවන්ට මව්පියන්ගෙන් නඩත්තු ලබාගත හැකි වයස් සීමාව කුමක් ද?**

1. වයස අවුරුදු 16කට අඩු දරුවන්ට නඩත්තු ගෙවීමට පියා සහ මව බැඳී සිටී.

2. තමාට තමා නඩත්තු කරගත නොහැකි වයස අවුරුදු 18-25 අතර දරුවෙකුට ද නඩත්තු ගෙවීමට පියා සහ මව බැඳී සිටී.

3. කවර හෝ වයසක ශාරීරික හෝ මානසික වශයෙන් ආබාධිත දරුවෙකු නඩත්තු කිරීමට ද පියා සහ මව බැඳී සිටී.

**අවජාත දරුවෙකුට පියාගෙන් නඩත්තු ලබාගත හැකි ද?**
ඔව්. එහෙත් ප්‍රබල සාක්ෂි මඟින් පීතෘභාවය තහවුරු කළ යුතුය.

**නඩත්තු නඩුවක් පවරන්නේ කෙසේ ද?**
මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතුය. නීතිඥවරයෙකුගේ සහාය ලබාගැනීම වඩා සුදුසු වේ. ආර්ථික අපහසුකම් ඇති භාර්යාවන්ට හා දරුවන්ට නීති ආධාර කොමිෂන් සභාවෙන් හෝ වෙනත් නීති ආධාර සපයන ආයතනයකින් නොමිලේ නීතිඥ සේවාව ලබාගත හැක. නඩත්තු සඳහා ඉල්ලීමක් දිවුරුම් පෙත්සමක් මඟින් කළ යුතුය.

භාර්යාව නඩත්තු නඩුවක් පවරන විට ඉල්ලුම්කාරිය ඇයයි. ළමයෙකු නඩත්තු සඳහා ඉල්ලීමක් කරන විට ඒ ළමයාටම හෝ භාරකරුට ඉල්ලුම් කළ හැකිය.

භාර්යාව, ස්වාමි පුරුෂයාට විරුද්ධව නඩත්තු ඉල්ලා නඩු පැවරූ විට මහේස්ත්‍රාත්වරයා විසින් ඉල්ලුම්කාරියගේ දිවුරුම් ප්‍රකාශයේ පිටපතක් සමඟ සිතාසියක් ස්වාමි පුරුෂයා වෙත යවනු ලැබේ.

ඉන්පසු විමසීමක් පවත්වා ස්වාමි පුරුෂයාගේ ආදායම ද භාර්යාවගේ වත්කම් හා අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන නඩත්තු වශයෙන් භාර්යාවට මාසික දීමනාවක් ගෙවන ලෙස ස්වාමි පුරුෂයාට නියෝග කරනු ලැබේ.

**පරීක්ෂණ පවත්වන අතරතුරු භාර්යාවගේ නඩත්තු ගැන ප්‍රතිකර්මයක් තිබේද ?**
තිබේ. නඩත්තු ඉල්ලීම ඉදිරිපත් කළ දින සිට මාසික දීමනාවක් ගෙවන ලෙසට අතුරු ආඥාවක් නිකුත් කළ හැකිය. පරීක්ෂණය අවසානයේ නඩත්තු ඉල්ලීමක් කළ භාර්යාවට මාසිකව නඩත්තු මුදලක් ගෙවන ලෙසට ස්වාමි පුරුෂයා වෙත නියෝග කරනු ලැබේ.

එසේ ගෙවීමට නියෝග කරන්නේ ඉහත සඳහන් පරිදි නඩත්තු පනතේ 2වන වගන්තියට අනුකූලව බව මතක තබා ගත යුතුය.

**ඉහත සඳහන් පරිදි භාර්යාවට මාසික නඩත්තු මුදලක් ගෙවන ලෙස අධිකරණය නියෝග කර ඇති විටක ඔහු ගෙවීම පැහැර හැරියහොත් ?**
නඩත්තු ගෙවීම පැහැර හරින වගඋත්තරකරුවකුගෙන් එම මුදල දඩයක් ලෙස අයකර ගැනීමට වරෙන්තු නිකුත් කිරීමට මහේස්ත්‍රාත්වරයාට බලය ඇත. එක් එක් මාසයක හිඟ නඩත්තු මුදල සඳහා මාසයක් බැගින් වූ සිරදඬුවමක් නියම කළ හැකිය.

**දරුවන්ට නඩත්තු ගෙවීමට අධිකරණ නියෝගයක් ඇති විට පියා හෝ මව එය පැහැර හැරියහොත් ?**
පෙර කී පරිදිම. මාසයක හිඟ නඩත්තු මුදලට මාසයක සිරදඬුවමක් ලැබේ.

**නඩත්තු මුදල අයකර ගැනීමට වෙනත් ප්‍රතිකර්ම තිබේද ?**
ඔව්. නඩත්තු ගෙවීම පැහැර හරින වගඋත්තරකරුවකුගේ වැටුප තහනම් කිරීමට මහේස්ත්‍රාත්වරයාට නියෝග කළ හැකිය.

> “එවැනි නියෝගයක් ඇතිවිට සේවා යෝජක විසින් නඩත්තු මුදල වගඋත්තරකරුගේ වැටුපෙන් අඩුකර අධිකරණය නියෝග කරන පරිදි එවිය යුතුය.”

**නඩත්තු මුදල තැපැල් කාර්යාලයක හෝ බැංකුවක තැන්පත් කරවා ගැනීමට නියෝගයක් ලබාගත හැකි ද?**
ඔව්.

**නඩත්තු ගෙවීමට කර ඇති නියෝගයක් මහේස්ත්‍රාත් අධිකරණයෙන්ම වෙනස් කරවා ගත හැකි ද?**

භාර්යාව අනාචාරයේ ජීවත්වීමට පටන් ගෙන ඇතිවිට ඇයට නඩත්තු ගෙවන ලෙසට කර ඇති නියෝගයක් අවලංගු කරන ලෙසට ස්වාමි පුරුෂයාට ඉල්ලා සිටිය හැකිය.

දරුවන්ට ප්‍රමාණවත් වත්කමක් ඇති බව ඔප්පු කොට ඔවුන්ට නඩත්තු ගෙවන ලෙසට කර ඇති නියෝගය පියාට හෝ මවට අවලංගු කරවා ගත හැකිය.

**මහේස්ත්‍රාත්වරයා විසින් නඩත්තු ගෙවීම සඳහා කර ඇති නියෝගයකට විරුද්ධව අභියාචනා කළ හැකි ද?**

ඔව්. මහේස්ත්‍රාත්වරයාගේ නියෝගයට විරුද්ධව මහාධිකරණයට අභියාචනා කළ හැකිය. අභියාචනා අධිකරණයේ තීන්දුවකට එරෙහිව නීතිමය ප්‍රශ්නයක් මත ශ්‍රේෂ්ඨාධිකරණයට අභියචනා කල හැකිය.

මහාධිකරණය වෙත අභියාචනා කළත් අභියාචනා පවතින කාලය තුළ නඩත්තු ගෙවීම නතර නොවේ.

එහෙත් සාධාරණ හේතු ඇතිවිට හේතු වාර්තා කර අභියාචනා විභාගය අවසානයේ නියෝගයක් ලබාදෙනතුරු නඩත්තු ගෙවීම නතර කිරීමේ නියෝගයක් ලබාදීමට මහාධිකරණයට බලය ඇත.

# දරුවන්ගේ භාරකාරත්වය

දරුවන්ගේ භාරකාරත්වය පිළිබඳ නඩුවක දී පිරිමි දරුවන්ගේ අයිතිය පියාටත් ගැහැණු දරුවන්ගේ අයිතිය මවටත් හිමි බවට සාමාන්‍ය ජනතාව අතර ඇති මතය වැරදි සහගතය.

දරුවාගේ භාරකාරත්වය මවට ලැබුනත්, පියාට ලැබුනත්, භාරකාරත්වය නොලැබුන පක්ෂය දරුවා හමුවීමට සහ ඇසුරු කිරීමට අයිතිය ඇත.

මවක් අවජාතක දරුවන් බිහි නොකරයි. රෝම ලන්දේසි නීතිය යටතේ දරුවන්ගේ ප්‍රමුඛ භාරකාරත්වය හිමි වුයේ පියාටය. ශ්‍රී ලංකාවේ පොදු නීතිය රෝම ලන්දේසි නිතිය බැවින් අප රටේ නෛතික තත්වය ද මෙය විය. එහෙත් බ්‍රිතාන්‍ය පාලකයන් යටතේ මෙරට විනිශ්චයකාර- -වරුන් ලෙස කටයුතු කළ ඉංග්‍රීසි ජාතිකයන් ඉංග්‍රිසි නීති සිද්ධාන්ත දරුවන්ගේ භාරකාරත්වය සම්බන්ධ නීතියට ඇතුල් කළහ. ඒ අනුව වර්තමානයේ දරුවන්ගේ භාරකාරත්වය පැවරිය යුත්තේ කවරෙකුට ද කියා තීරණය කරන්නෙ ඉංග්‍රීසි නීති සිද්ධාන්තයක් වූ දරුවාගේ යහපත යන සංකල්පය පදනම් කරගෙනය.

රෝම ලන්දේසි නීතිය අනුව බාල වියේ පසුවන දරුවන්ගේ භාරකාරත්වය සම්බන්ධව පූර්ණ බලය පියා සතුය.

අපේ රට බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති සමයේ කටයුතු කළ ඉංග්‍රීසි විනිසුරන් ඉංග්‍රීසි නීති සිද්ධාන්ත මෙරට නීතිය තුළට සීරුවෙන් රිංගවා ඇත.

**දරුවන්ගේ භාරකාරත්වය කවරකුට ලබාදිය යුතුද යන ගැටලුව පැන නගින්නේ කුමන අවස්ථාවල ද?**

අඹුසැමියන් වෙන්වී සිටින විට ද දරුවන්ගෙ නඩත්තු සම්බන්ධ නඩුවක දී ද දරුවන්ගේ භාරකාරත්වය පිළබඳ ප්‍රශ්ණය මතුවිය හැකිය.

**හබයාස්ක්‍රොප්පුස් නඩු (සිවිල්)**

අඹුසැමියන් නීතියානුකූලව වෙන්වී නැති අවස්ථාවක බිරිඳ, දරුවා සමඟ ඇගේ නිවසේ වාසය කරන අතර. සැමියා ඔහුගේ නිවසේ වාසය කරයි. සැමියා විසින් බිරිඳ සමඟ සිටින දරුවා බලහත්කාරයෙන් පැහැරගෙන ගිය අවස්ථාවකදී අදාළ ප්‍රදේශයේ අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත සිවිල් හබයාස්ක්‍රොප්පුස් ආඥාවක් ලබා ගැනිම පිණිස ඉල්ලීක් කළ යුතුය. දිසා අධිකරණය විසින් දරුවා අධිකරණයට කැටුව ඒමට නියෝගකර විමසීමක් පවත්වා නියෝගයක් කරනු ලැබේ.

**බාලවයස්කාර දරුවකු වැඩිහිටියෙකු බවට පත්වන වයස් සීමාව කුමක් ද?**

වයස අවුරුදු 18ක් සම්පූර්ණ වූ විට ළමයෙක් වැඩිහිටියෙක් බවට පත්වේ. එබැවින් දරුවන්ගේ භාරකාරත්වය පිළිබඳ ප්‍රශ්න පැන නගින්නේ වයස අවුරුදු 18ට අඩු දරුවන් ගැනය.

දරුවන්ගේ භාරකාරත්වය පිළිබඳ නඩුවල දී දරුවාගේ සුභ සිද්ධිය ප්‍රමුඛතම කරුණ ලෙස සැලකීම ඉංග්‍රීසි නීති සිද්ධාන්තයකි.

දරුවාගේ යහපත වඩාත් සැලසෙන්නේ එම දරුවාගේ භාරකාරත්වය පියාට පැවරීමෙන් ද, නැතිනම් මවට පැවරීමෙන් ද යන කරුණ ඉංග්‍රීසි විනිසුරුවරු සොයා බැලූහ.

නූතන සංකල්පය වන්නේ දරුවාගේ සුභ සිද්ධිය ප්‍රමුඛ කොට සලකා දරුවාගේ භාරකාරත්වය පියාට පැවරීමෙන් ද, නැතිනම් මවට හෝ වෙනත් පක්ෂයකට ප්‍රදානය කිරීමය.

**දරුවාගේ සුභ සිද්ධිය සොයා බැලීමේ දී වැඩි අවධානය යොමු කරන්නේ කවර කරුණු කෙරෙහි ද?**

දරුවාට පදිංචි ස්ථානයක්, පෝෂ්‍යදායක ආහාර, ලෙඩ රෝගවලට ප්‍රතිකාර, මානසික සුවය, විවේකය, ආරක්ෂාව, සදාචාරාත්මක පරිසරය, මනා අධ්‍යාපනය වැනි සියලුම කරුණු පිළිබඳව අධිකරණය සළකා බලනු ලැබේ.

**දරුවාගේ අයිතිය පියාට හෝ මවට පැවරීමේ දී උසාවිය දරුවාගේ කැමැත්තට ඉඩ දෙනවා ද?**

වයස අවුරුදු 16ට වැඩි ගැහැණු දරුවන්ගෙන් ද වයස අවුරුදු 14ට වැඩි පිරිමි ළමයින්ගෙන් ද අධිකරණය කැමැත්ත විමසා බලයි. එහෙත් දරුවාගේ කැමැත්ත එකම සාධකය නොවේ.

**අනාචාරයේ හැසිරීමේ වරද මත භාර්යාවට විරුද්ධව ස්වාමි පුරුෂයකු දික්කසාද නඩු තීන්දුවක් ලබාගත් අවස්ථාවක අදරුවකුගේ භාරකාරත්වය ස්වාමි පුරුෂයාට ලබාගත හැකි ද?**

සාමාන්‍යයෙන් අහිංසක පක්ෂය වෙත දරුවන්ගේ භාරකාරත්වය ලබා දෙයි.

මෙවැනි අවස්ථාවක අධිකරණය නිර්දෝෂී පක්ෂයේ අයිතිවාසිකම් ද දරුවාගේ යහපත ද යන කරුණු දෙක සමතුලනය කොට තීරණයකට එළඹෙනු ඇත.

**පියා සහ මව යන දෙදෙනාම දරුවකුගේ භාරකාරත්වය ඉල්ලා හබ කරන විට දරුවාගේ භාරකාරත්වය ඒ දෙදෙනාටම පැවරිය හැකි ද?**

නොහැක

**දරුවාගේ භාරකාරත්වය අහිමි වු පියට හෝ මවට දරුවා හමුවිය හැක්කේ කෙසේ ද?**
දරුවාගේ භාරකාරත්වය මව හෝ පියා යන දෙදෙනාගෙන් එක් පක්ෂයකට පැවරීමේ නියෝගයක් සමඟම භාරකාරත්වය අහිමි වූ පක්ෂයට දරුවා දැක බලා ගැනීමට ඉඩ සලසමින් ද විධානය කරනු ලැබේ.

දරුවා හමුවීමේ අවස්ථාව දෙදෙනාගේ එකඟතාව මත සති අන්තයකදී නියමිත වෙලාවක නියමිත ස්ථානයක දී විය හැකිය. සමහර විට දරුවා සති අන්තය තුළ තමන් ළඟ රඳවා ගැනීමට ද භාරකාරත්වය අහිමි වු පක්ෂයට ඉඩ ලබා දෙයි. බොහෝ විට පන්සලක හෝ පල්ලියක් හමුවීමේ ස්ථානය ලෙස නම් කෙරේ. එම ස්ථානය මුහුදු වෙරළ හෝ උද්‍යානයක් විය හැකිය.

**අවජාත දරුවකුගේ භාරකාරත්වය ලැබෙන්නේ කාට ද?**

අවිවාහක මවකට ලැබෙන දරුවා අවජාත දරුවෙකි. එවැනි දරුවකුගේ භාරකාරත්වය මවට හිමි වේ.

**ධනවත් පියෙක් හා දුප්පත් මවක් දරුවකුගේ භාරකාරත්වය ලබා ගැනීමට තරඟ කරන විට දී ප්‍රමුඛතාවය කාට ද?**

සියලුම යස ඉසුරුවලට වඩා මවකගේ උනුසම හා සෙනෙහස දරුවකුට සැපතක් බව අධිකරණය තීරණය කර ඇත.

**දික්කසාද නඩුවක දී දරුවකුගේ භාරකාරත්වය සම්බන්ධව දිසා අධිකරණය දුන් තීන්දුවකට විරුද්ධව අභියාචනය කළ හැකි ද?**

හැක. දිසා අධිකරණයේ තීන්දුවකට විරුද්ධව අභියාචනා අධිකරණය වෙත අභියාචනා කළ හැකිය. අභියාචනා අධිකරණයේ තීන්දුවකට විරුද්ධව නීතිමය ප්‍රශ්නයක් මත ශ්‍රේෂ්ඨාධිකරනයට අභියාචනා කළ හැකිය.

# දරුවෙකු කුලවද්දා ගැනීම හෙවත් දරුකමට හදා ගැනීම

අඹුසැමි යුවලකට හෝ තනි පුද්ගලයෙකුට දරුවෙකු කුලවද්දා ගැනීමට (දරුකමට හඳගැනීම) පුළුවනි.

ස්වාභාවික දෙමාපියන්ගේ දරුවෙකුට ඇති සියලුම අයිතිවාසිකම් හා යුතුකම් අධිකරණ නියෝගයක් මත හදාගන්නා දරුවෙකුට ද ඇත.

අධිකරණ නියෝගයක් රහිතව දරුවෙකු හදා ගැනීම එම දරුවාට කරන බලවත් වරදකි.

දරුවන් නැති යුවලක් දුප්පත් නැදැයෙකුගේ දරුවෙකු හෝ අවිවාහක මවකගේ දරුවෙකු දරුකමට හදා ගන්නා අවස්ථා සුලභය. ගැහැණු දරුවන් පමණක් සිටින අඹු සැමියන් පිරිම දරුවෙකු ද පිරිමි දරුවන් පමණක් සිටින අඹු සැමියන් ගැහැණු දරුවකු ද දරුකමට හදා ගන්නා අවස්ථා ද දක්නට ඇත.

දරුවෙකු නිත්‍යාණුකූලව දරුකමට හදා ගැනීමේ නියෝගයක් ලබා ගැනීම පිණිස දිසා අධිකරණයේ කුලවැද්දුම් නඩුවක් පැවරිය යුතුය.

**දරුවෙකු දරුකමට හදා ගැනීමේ නියෝගයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ යුත්තේ කුමන උසාවියෙන් ද ?**

ඉල්ලුම්කරු හෝ දරුවා පදිංචි ප්‍රදේශයේ අධිකරණය බලය ඇති දිසා අධිකරණයෙන් එම ඉල්ලීම කළ යුතුය.



**දරුකමට හදා ගැනීමේ නියෝගයක් ලබා ගැනීමට ඉල්ලුම් කළ හැක්කේ කාට ද?**
අඹුසැමි යුවලකට හෝ තනි පුද්ගලයෙකුට ඉල්ලුම් කල හැකියි. ඒ හැර පුද්ගලයන් දෙදෙනෙකුට හෝ වැඩි ගනනකට ඉල්ලුම් කළ නොහැකිය.

**දරුකමට හදා ගැනීමට ඉල්ලා සිටින කෙනෙකුට වයස් සීමාවක් තිබේ ද?**
ඉල්ලුම්කරුගේ වයස අවුරුදු 25කට වඩා වැඩි විය යුතුය. ඉල්ලුම්කරුගේ වයස, දරුකමට හදා ගැනීමට අපේක්ෂිත දරුවාගේ වයසට වඩා අවුරුදු 21 කින් වැඩිවිය යුතුය.

මෙම අවුරුදු 21ක වයස් පරතරය පහත සඳහන් අවස්ථාවල දී බල නොපායි

**1**
දරුවා, ඉල්ලුම්කරුගේ කෙළින්ම පැවතෙන්නෙකු වන විට,

**2**
දරුවා, ඉල්ලුම්කරුගේ පූර්ණ හෝ අර්ධ සහෝදරයෙකු හෝ සහෝදරියක හෝ ඔවුන්ගෙන් පැවතෙන්නෙකු වන විට,

**3**
දරුවා, ඉල්ලුම්කරුගේ බිරිඳගේ හෝ ස්වාමි පුරුෂයාගේ වෙනත් කසාදයක දරුවෙකු වනවිට,

**තනි පුද්ගලයෙකු දරුවෙකු දරුකමට හදා ගැනිමට ඉල්ලා සිටින අවස්ථාවක දී බලපාන නීතිමය තත්වය විස්තර කරනවා ද?**
තනි පුද්ගලයෙකුටත් දරුවෙකු දරුකමට හදා ගැනීමේ නියෝගයක් ලබාගත හැකිය. එහෙත් එකම ඉල්ලුම්කරු පුරුෂයෙකු වන විට දරුවා ගැහැණු ළමයෙකු නම් දරුකමට හදා ගැනීමේ නියෝගයක් ලබා නොදෙයි.

එහෙත් විශේෂ ඥාති සබඳතා ඇති අවස්ථාවල ඒ සඳහාත් නියෝගයක් ලබාගත හැකිය.

**අඹුසැමි දෙදෙනාම ජීවතුන් අතර සිටින අවස්ථාවක එක් අයෙකු පමණක් ඉල්ලුම් කොට දරුවෙකු දරුකමට හදා ගැනීමේ නියෝගයක් ලබා ගත හැකි ද?**
අඹුසැමි දෙදෙනාගෙන් එක් අයෙකුට අනෙකාගේ කැමැත්ත නැතිව දරුකමට හදා ගැනිමේ නියෝගයක් ලබාගත නොහැකිය.

එහෙත් පහත සඳහන් අවස්ථාවල දී අඹුසැමි දෙදෙනාගෙන් එක් අයෙකුගේ ඉල්ලීමක් මත දරුකමට හදා ගැනීමේ නියෝගයක් ලබාගත හැකිය.

එක් පාර්ශ්වකරුවෙකු සොයා ගැනීමට නොහැකි අවස්ථාවක.

එක් පාර්ශ්වකරුවෙකු මානසික රෝගයකින් පෙලෙන අවස්ථාවක.

දෙදෙනා දික්කසාද වී සිටින අවස්ථාවක.

**දරුවෙකු දරුකමට හදා ගැනීමේ නියෝගයක් කිරීමේ දී ස්වාභාවික දෙමාපියන්ගේ කැමැත්ත ලබා ගත යුතු ද?**
ඔව්.
පහත සඳහන් ආකාරයට කැමැත්ත ලබාගත යුතුය.

1. විවාහක යුවලකගේ දරුවෙකු නම් දෙදෙනාගේම කැමැත්ත ලබාගත යුතුය.

2. අවජාතක දරුවෙකු නම් මවගේ කැමැත්ත ලබාගත යුතුය.

3. වෙනත් කෙනෙකුගේ භාරකාරත්වයේ සිටින දරුවෙකු නම් එහි භාරකරුගේ කැමැත්ත ලබාගත යුතුය.

**කැමැත්ත දිය යුතු කෙනෙකුගේ කැමැත්ත ලබා නොගෙන දරුකමට හදා ගැනීමේ නියෝගයක් කළ නොහැකි ද?**
බාලවයස්කාර දරුවන්ගේ ඉහළම භාරකරු දිසා අධිකරණය බැවින් එහි අනුමැතිය ලබා ගත හැක.

ඉහත සඳහන් කැමැත්ත ලබාදිය යුතු කෙනෙකු,

දරුවා අතහැර දමා ගොස් ඇති විට

මානසික රෝගයකු වන විට

දරුවා නඩත්තු කිරීම නොසලකා හැර ඇතිවිට, ඔවුන්ගේ කැමැත්ත නොවිමසා දරුකමට හදා ගැනීමේ නියෝගයක් කිරීමට දිසා අධිකරණයට බලය ඇත

**දරුකමට හදා ගැනීමේ නියෝගයක් නිකුත් කිරීමට පෙර අධිකරණය දරුවාගේ කැමැත්ත විමසනවා ද?**
වයස අවුරුදු 10ට වැඩි දරුවන්ගේ කැමැත්ත විමසා බලනු ලබයි. එබැවින් දරුවා බහ තෝරන අවධිය එළඹෙන්නට පෙර දරුකමට හදා ගැනීමේ නියෝගයක් ලබා ගැනීම නුවනට හුරුය.

**දරුකමට හදා ගන්නා දරුවාගේ නම වෙනස් කළ හැකි ද ?**
ඉල්ලුම්කාර පියාගේ පෙළපත් නම දරුවාට හිමි වේ. ඉල්ලුම්කරුවන්ගේ අභිමතය පරිදි දරුවට නමක් ලබාදිය හැකිය.

**දරුවන් විකිණීමට හැකි ද?**

දරුවෙකු හදා ගැනීම වෙනුවෙන් කිසිවෙකුට මුදලක් හෝ ත්‍යාගයක් ලබාදීම හෝ ලබා ගැනීම හෝ ඒ සඳහා පොරොන්දු වීම තහනම්ය. එසේම මුදලක් ලබා ගැනීම හෝ ඒ සඳහා පොරොන්දුවක් ලබාගැනීමත් තහනම්ය.

**විදේශිකයෙකුට දරුවෙකු දරුකමට හදා ගැනීමට අවශ්‍ය වූ විට ගතයුතු ක්‍රියා මාර්ගය කුමක් ද ?**

ඕනෑම රටක පුරවැසිකම ඇති අඹුසැමි යුවලකට ශ්‍රී ලංකාවේ දරුවකු දරුකමට හදා ගැනීමට ඉල්ලුම් කළ හැකිය. දරුකමට හදා ගැනීමට ඉල්ලා සිටින දරුවා රජය විසින් පවත්වාගෙන යන අනත් දරු නිවාසයක හෝ අනත් දරු ආඥා පනත යටතේ ලියාපදිංචි කර ඇති අනත්දරු නිවාසයක සිටින දරුවකු විය යුතුය. එසේම පරිවාස හා ළමා ආරක්ෂක කොමසාරිස් විසින් ඉහත කී ස්ථානයකින් තෝරා ගන්නා ලද දරුවෙකු විය යුතුය. තවද ඉල්ලුම්කරුවන් පිළිබඳව ඔවුන්ගේ රටේ පිළිගත් ආයතනයකින් ලබාගත් පරිසර අධ්‍යාපන වාර්තාවක් ද ඔවුන් පදිංචි ප්‍රදේශයේ බලධරයන්ගෙන් ලබාගත් පොලිස් වාර්තාවක් ද එරට සිටින ශ්‍රී ලංකා තානාපතිවරයා විසින් සහතික කොට ලබාගෙන එම ලියවිලි ද පරිවාස හා ළමා ආරක්ෂණ කොමසාරිස්ගේ වාර්තාවට ඇමිණිය යුතුය.

**දරුකමට හදා ගැනීමේ අධිකරණ නියෝගයක් ලබා ගෙන විදේශික යුවලක් දරුවා ගම රටට ගෙන ගිය පසු ?**

එම විදේශික යුවල දරුවාගේ වයස අවුරුදු 10 වනතුරු දරුවා පිළිබඳ ප්‍රගති වාර්තා මෙරට පරිවාස හා ළමා ආරක්ෂණ කොමසාරිස්ට එවිය යුතුය.

**මෙවැනි දරුවන් විකුණන ජාවාරම් නැවැත්වීමට නීති පනවා තිබෙනවා ද?**

ඔව්. 1992 අංක 15 දරණ ළමුන් දරුකමට හදා ගැනීමේ (සංශෝධන) පනතේ ඒ සඳහා ප්‍රතිපාදන අන්තර්ගතය.

1 යම් ළමයෙකු ලැබීමට සිටින කාන්තාවක් ඇගේ ගර්භනී කාලය තුළ දී,

2 ළමයකු ඔහුගේ මව සමඟ හෝ මව නොමැතිව එම ළමයා දරුකමට හදා ගැනීමට ලබාදීම සඳහා නීති විරෝධී ලෙස රඳවා ගන්නා කෙනෙකු දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකරයි.

එම වරදකට වැරදිකරු වූ අයෙකුට උපරිම වශයෙන් රුපියල් 20,000.00 ක දඩයක් හෝ අවුරුදු 2ක සිර දඬුවමක් හෝ එම දඬුවම් දෙකම හෝ පැනවිය හැකිය.

**ළමයෙකු දරුකමට හදා ගැනීමේ නියෝගයක් ලබා ගැනීම සඳහා නඩුවක් පවරන්නේ කෙසේ ද?**

මේ සම්බන්ධව ශ්‍රී ලංකාවේ නීතිය 1941 අංක 24 හා 1943 අංක 54 දරණ ළමයින් දරුකටම හදා ගැනීමේ ආඥා පනත්වල සඳහන්ය.

ළමයෙකු දරුකමට හදා ගැනීමේ නියෝගයක්, පෙත්සමක් සහ දිවුරුම් පෙත්සමක් මඟින් ඉල්ලා සිටිය යුතු අතර, ඒ සමඟ සහජාත දෙමාපියන්ගේ හෝ සහජාත මවගේ කැමැත්ත දීමේ දිවුරුම් පෙත්සම ද ඉදිරිපත් කළ යුතුය.

## විවාහ පොරොන්දු කඩ කිරීම

විවාහ පොරොන්දුවක් ඇතුළත් පෙම් හසුනක් දින රහිත චෙක්පතක් වැනිය. පෙම් හසුන ලියූ තැනැත්තා විවාහවීම පැහැර හැරියොත් නඩුවක් පවරා අලාභ ලබාගත හැකිය. එය ලිඛිත විය යුතු අතර කොන්දේසි විරහිත විය යුතුය නමුත් විවාහ පොරොන්දුවක් කඩ කිරීම ලිඛිත විය යුතු නැත.

**වලංගු විවාහ පොරොන්දුවක් ඇති කර ගත හැක්කේ කාට ද?**

වලංගු විවාහයක් කරගැනීමට සුදුසුකම් ඇති අයට පමණක් වලංගු විවාහ පොරොන්දුවක් ඇති කර ගත හැක.

**විවාහකයකුට විවාහ පොරොන්දු දිය හැකි ද?**

විවාහකයෙකුට විවාහ පොරොන්දු දිය හැකි මුත් එම පොරොන්දු නීතිය ඉදිරියේ වලංගු නැත.

**බලහත්කාරයෙන් විවාහ පොරොන්දුවක් ඇතුළත් ලිපයකට අත්සන් ගත්විට නීතිමය තත්ත්වය කුමක් ද?**

විවාහ පොරොන්දුව ගිවිසුමක් බැවින් නිදහස් කැමැත්ත තිබිය යුතුය. අයුතු බලපෑම්, වංචාව, බලකිරීම මත විවාහ පොරොන්දුවක් දුන්විට වලංගු නැත.

හොඳ සිහිය නැති අවස්ථාවක හෝ හොඳ සිහිය නැති කෙනෙකු දුන් විවාහ පොරොන්දුවක් ද වලංගු නැත. සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 20(3) වගන්තියේ ව්‍යාතිරේඛයේ සඳහන් පරිදි නඩු පැවරිය හැක්කේ ලිඛිතව දෙන ලද විවාහ පොරොන්දුවක් කඩ කිරීමක් සම්බන්ධයෙනි.

**විවාහ පොරොන්දුවක් කඩ කිරීම ගැන නඩු පැවරීමේ දී නිශ්චිත කාල සීමාවක් තිබෙනවා ද?**
තිබේ. පොරොන්දුව කඩ කළ දින සිට වසර 2ක් ඇතුලත නඩු පැවරීම කළ යුතුය.

1. විත්තිකරු පදිංචි වී සිටින ස්ථානය
2. පොරොන්දුව ඇති කරගත් ස්ථානය
3. පොරොන්දුව කඩකළ ස්ථානය

යන ඕනෑම ස්ථානයක් සම්බන්ධව අධිකරණ බලය ඇති දිසා අධිකරණයේ නඩු පැවරිය හැකිය.

**විවාහ පොරොන්දුවක් කඩ කළ විට අධිකරණය වෙත ගොස් ලබාගත හැකි ප්‍රතිකර්මය කුමක් ද?**

අලාභ ලබාගත හැකිය.

**ලබා ගත හැකි අලාභ මොනවා ද ?**

**1**

විවාහ පොරොන්දුව කඩ කළ නිසා සිදුවන පාඩුව ලබාගත හැකිය.

**2**

ගිහිසුම කඩ කිරීම නිසා සිදුවූ මානසික වේදනාව සම්බන්ධව ද අලාභ ලබාගත හැකිය.



## ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය

යමෙකු තම නිවසට යැමට ආශා කරන්නේ ද, එම නිවසෙන් පිට වන අවස්ථාවේ දී යම් දුකක් දැනෙන්නෙ ද, හෙතෙම සතුටින් එම නිවසෙහි ගත කරන බවට එය සාක්ෂියකි. තම මුළු ජීවිත කාලයම ගත කරනු ලබන නිවස මිහිපිට අපායක් නම් හෙතෙම මුළු ජීවිත කාලයම දුකින් ගත කරන්නෙකි.

නිවසින් බාහිර පුද්ගලයකු අපහට යම් පීඩාවක් හිරිහැරයක් හෝ අතවරයක් සිදු කරන්නේ නම්, ඒ සඳහා සැකසුණු නීතිරීති මාලාවක් අප රටෙහි බොහෝ කාලයක සිට ක්‍රියාත්මකට පවති.

නමුත තම නිවස තුළ තමාගේ ඥාතියකුගෙන් සිදුවන මානසික හා ශාරීරක පීඩා හිරිහැර වළක්වා ගැනීම සඳහා පැහැදිලි නීතියක අවශ්‍යතාවය දැනෙමින් තිබුණු අවධියක 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත එළිදැක්විණි.

**"මෙහි විශේෂත්වය නම් යම් කෙනෙකුට තමාට නෑදෑ සම්බන්ධතාවයක් ඇති වෙනත් කෙනෙකු ගෙන් ඇති වන ශාරීරක වද හිංසාව මෙන්ම මානසික පීඩාව සඳහා ද අධිකරණය පිහිට පතා යෑමට හැකිවීමය"**

මෙම පනත යටතේ ශාරීරක වද හිංසාව යනුවෙන් දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් වන මනුෂ්‍ය ශරීරය සම්බන්ධව සිදුකරන වැරදි, සාපරාධී බියගැන්වීම්, බලෙන් ලබා ගැනීම, තුවාල සිදු කිරීම, අඩන්--තේට්ටම් කිරීම, බලහත්කාරය, ලිංගික අතවර කිරීම, අපහරණය, ව්‍යභිචාරය යනාදී වරදවල් රාශියක් ඇතුළත් වේ.

මානසික පීඩාව වශයෙන් උද්වේගශීලි බැනවැදීම අදහස් වේ. මෙය බරපතල ස්වාභාවයෙන් අවමන් කිරීමක් හෝ අපහාස කිරීමක් විය යුතු අතර, එය ක්‍රියාකලාපයකින් යුක්ත විය යුතුය. එමෙන්ම පීඩාවට පත් තැනැත්තාට බරපතල හා ක්ෂණික පීඩාවක් ඇති කිරීමේ හැකියාව තිබිය යුතුය.

මෙවැනි පීඩාවක් ලක් ව තැනැත්තාට හෝ එම තැනැත්තා වෙනුවෙන් වෙනත් බලයලත් නිළධාරියෙකුට අධිකරණයට මෙම කරුණු ඉදිරිපත් කළ හැක. අතවරයට පත් තැනැත්තා ළමයෙකු නම් පියාට, මවට භාරකරුවෙකුට, ළමයා පදිංචි ස්ථානයේ සිටින වෙනත් කෙනෙකුට හෝ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් බලය පවරන තැනැත්තෙකුට එම ළමයා වෙනුවෙන් අධිකරනයට ඉදිරිපත් විය හැකියි.

මෙම නඩුවල ඇති විශේෂත්වය වන්නේ මෙම ඉල්ලීම් වහාම සලකා බැලීම අධිකරණය විසින් කරනු ලැබීමයි. එහිදී පීඩාවට පත් තැනැත්තාගේ ආරක්ෂාව සහතික කිරීමට පියවර ගැනීම අවශ්‍ය බවට අධිකරණය සෑහීමකට පත්වන්නේ නම් අතුරු ආරක්ෂක ආඥාවක් අධිකරණය සෑහීමකට පත්වන්නේ නම් අතුරු ආරක්ෂක ආඥාවක් අධිකරණය විසින් වහාම නිකුත් කරනු ඇත. එහිදී පීඩාව සිදුකරනු ලබන්නාට පීඩාවට පත්වන තැනැත්තා වෙත ප්‍රවේශවීම තහනම් කරමින් මෙම ආඥාව නිකුත් කරනු ඇත.

මෙම අතුරු නියෝගය විත්තිකරු වෙත භාරදී ඔහුව අධිකරණය වෙත කැඳවීම කරනු ලබයි. දින 14ක් ඇතුළත දිනක දී විමසීමට නියම කරනු ලබයි.

විමසීමේ දී වගඋත්තරකරු අධිකරණයට පැමිණි තමාට එරෙහිව ආරක්ෂක ආඥාවක් නොකල යුත්තේ මන්ද යන්නට හේතු දැක්විය යුතුය.

අධිකරණය සියලු කරුණු සළකා බලා ආරක්ෂක ආඥාවක් නිකුත් කළ යුතු බවට පෙනී යයි නම් ආරක්ෂක ආඥාවක් නිකුත් කරනු ලබයි.

මෙම පනත යටතේ අධිකරණයට කළ හැකි අනෙකුත් ආඥා

පවුල් උපදේශයට යොමු කිරිම

සමාජ සේවා උපදේශයට යොමු කිරිම

මනෝ වෛද්‍යවරයෙකුට යොමු කිරිම

පීඩාවට පත් තැනැත්තා වෙත විශේෂ ආරක්ෂක ආඥාවක් සැපයීම අවශ්‍ය බවට අධිකරණයට හැඟේ නම් ආඥාව ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය කරන ලෙසට නියම කළ හැක.

තවද වගඋත්තරකරු ලඟ ආයුධ වෙතොත් ඒවා ඉවත් කිරීමට ද,

වගඋත්තරකරු පෙත්සම්කරුගේ සේවා ස්ථානයට හෝ පාසැලට හෝ මඟතොටට පැමිණ පීඩා කරන්නේ නම් හෝ අපහසුතාවයට පත් කරන්නේ නම් එය වැළැක්වීමේ නියෝගයක්,

පීඩාවට පත් අය පීඩාව කරන තැනැත්තාගෙන් යැපෙන්නේ නම් නඩත්තු ගෙවීමේ ආඥාවක්,

පීඩාවට පත් අයගේ ආරක්ෂාව සෞඛ්‍ය හා සුභසාධන සැලසීමට අවශ්‍ය පරිපූරක ආඥාවක්,

පීඩාවට පත් අයගේ පෞද්ගලික දේපළ එකතු කර ගැනීමට පොලීසියේ සහය ලබාදීමේ නියෝගයක්,

තාවකාලික නවාතැන් පහසුකම් සැපයීමේ නියෝගය,

අධිකරණයට මැනවැයි හැඟෙන වෙනත් පරිපූරක ආඥාවද වේ,

## ආඥාව උල්ලංඝනය කළහොත්

රු.10,000.00 ක් නොඉක්මවන දඩයකින් හෝ එක් අවුරුද්දකට නොවැඩි බන්ධනාගාරගත කිරීමෙන් ඒ තැනැත්තාට දඬුවම් කළ හැක.

## අතුරු ආඥාවක් ආරක්ෂක ආඥාවක් බවට පත් වන අවස්ථා

අතුරු ආඥාවක් යනු මුල් අවස්ථාවේ දී පෙත්සම්කරු විසින් කරුණු තහවුරු කළ පසු අධිකරණය විසින් තාවකාලිකව කරනු ලබන ආඥාවකි.

ආරක්ෂක ආඥාවක් යනු වගඋත්තරකරු විසින් අධිකරණයට පැමිණ විමසීමක් පවත්වා තවදුරටත් මෙම ආඥාව බලාත්මක කිරීම කළ යුතු බවට අධිකරනයට පෙනී යයි නම් නිකුත් කරනු ලබන ආඥාවයි.

මෙය මුල් අවස්ථාවේ දී උපරිමය මාස 12ක් දක්වා කාලයකට නිකුත් කළ හැක.

ඉන්පසුව නඩුව කැඳවා දෙපාර්ශවයම සමථයකට පත්වේ නම් පෙරකී ආඥාව විසුරුවා හරිනු ලැබේ.



# LAC මධ්‍යස්ථාන පිහිටි ස්ථාන

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 011-2433618 | මන්නාරම | 023-2222045 |
| අක්කරෙයිපත්තු | 067-2279462 | මාරවිල | 032-2254443 |
| අම්පාර | 063-2223495 | මාතලේ | 066-2224828 |
| අනුරාධපුර | 025-2224465 | මාතර | 041-2233815 |
| අත්තනගල්ල | 033-2297020 | මතුගම | 034-2249262 |
| අවිස්සාවේල්ල | 036-2233857 | මාවනැල්ල | 035-2247272 |
| බද්දේගම | 091-2292051 | මීනුවන්ගොඩ | 011-2297790 |
| බදුල්ල | 055-2225759 | මොණරාගල | 055-2276891 |
| බලංගොඩ | 045-2289099 | ගල්කිස්ස | 011-2718708 |
| බලපිටිය | 091-2255753 | මුලතිවු | 021-2290077 |
| බණ්ඩාරවෙල | 057-2224733 | මුයිතූර් | 026-2238777 |
| බත්තරමුල්ල | 011-2877687 | නාවලපිටිය | 054-2224227 |
| මඩකලපුව | 065-2225399 | මීගමුව | 031-2281080 |
| චාවකච්චේරිය | 021-2270882 | නිකවැරටිය | 037-2260203 |
| හලාවත | 032-2222175 | නුගේගොඩ | 011-2809068 |
| දඹුල්ල | 066-2284551 | නුවරඑළිය | 052-2235260 |
| දෙයියන්දර | 041-2268077 | පානදුර | 038-2244822 |
| දෙනියාය | 041-2271128 | පේදුරුතුඩුව | 021-2260212 |
| ඇඹිලිපිටිය | 047-2230299 | පොල්ගහවෙල | 037-2243039 |
| ගල්ගමුව | 037-2253290 | පොළොන්නරුව | 027-2226572 |
| ගාල්ල | 091-2226124 | පොතුවිල් | 063-2248485 |
| ගම්පහ | 033-2248804 | පුගොඩ | 011-2405333 |
| හම්බන්තොට | 047-2221092 | රත්නපුර | 045-2226899 |
| හැටන් | 051-2222390 | තංගල්ල | 047-2240122 |
| හිඟුරක්ගොඩ | 027-2245521 | තඹුත්තේගම | 025-2276259 |
| හෝමාගම | 011-2748813 | තිස්සමහාරාමය | 047-2239611 |
| හොරණ | 034-2265244 | ත්‍රිකුණාමලය | 026-2226328 |
| යාපනය | 021-2224545 | වාලච්චේනයි | 065-2258349 |
| කඩවත | 011-2922440 | වව්නියාව | 024-2221863 |
| කඩුවෙල | 011-2548150 | වලස්මුල්ල | 047-2245566 |
| කැකිරාව | 025-2263536 | වැල්ලවාය | 055-2274466 |
| කල්මුනේ | 067-2223710 | වරකාපොළ | 037-2277075 |
| කළුතර | 034-2222017 | වාරියපොල | 037-2268199 |
| මහනුවර | 081-2388978 | වැලිමඩ | 057-2244860 |
| කන්තලේ | 026-2234521 | මල්ලකම් | 021-2059170 |
| කැබිතිගොල්ලෑව | 025-2298101 | පුත්තලම් | 032-2266636 |
| කෑගල්ල | 035-2231790 | සියඹලාණ්ඩුව | 055-2279250 |
| කිලිනොච්චි | 021-2285618 | දෙහිඅත්තකණ්ඩිය | 027-2250700 |
| කුලියාපිටිය | 037-2284611 | LT-බොරැල්ල | 011-2698003 |
| කුරුණෑගල | 037-2229641 | ගලගෙදර | 081-2061025 |
| මහියංගනය | 055-2258332 | වත්තල | 011-2935907 |
| මාහෝ | 037-2275075 | හෙට්ටිපොල | 037-2291915 |

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**

නො.129, මහාධිකරණ සංකීර්ණය,
හල්ෆ්ට්ස්ඩෝර්ප් වීදිය, කොළඹ 12.

011 2433618

legalaidcommission1978@gmail.com

www.legalaid.gov.lk

